ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2509/12 - 2026 ඔක්තෝබර් මස 06 වැනි අඟහරුවාදා - 2026.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

25අ වගන්තිය සමඟ කියවිය යුතු 27(1) (ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමඟ කියවිය යුතු (27)(1) (ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තිය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ගැනීමෙන් පසුව, මේ නියමය මඟින්, එකී පනත යටතේ සාදන ලද 2025 ජූලි මස 22 වැනි දින අංක 2446/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ I වැනි උපලේඛනයේ, I කොන්දේසිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

I වන උපලේඛනය

කොන්දේසි

1. (මෙහි මින් මතු ''ආයතනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය විසින්, මෙහි II වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 90 ක් සහිත, (එස්.එල්.කියූ.එෆ්. 5 වන ස්ථරයේ) රෙදිපිළි හා ඇඟලුම් අධ්‍යයනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සම්බන්ධයෙන්,

    අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව, ජීව විද්‍යාව හෝ තාක්ෂණ විෂයය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) හෝ ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම; හෝ

ආ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) හෝ ඊට සමාන සුදුසුකමක් ලබා තිබීම;

සහ

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී අවම වශයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය සහ විද්‍යාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ (සී) හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

ආචාර්ය **හරිනි අමරසූරිය**,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා
වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2026 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0033